2011

වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றும்
ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS

පුනරුත්ථාපන අධිකාරිය
புனர்வாழ்வு அதிகாரசபை
REHABILITATION AUTHORITY

අංක 95, ආනන්ද රාජකරුණා මාවත කොළඹ 10.
இல. 95, ஆனந்த ராஜகருணா மாவத்தை கொழும்பு 10.
No. 95, Ananda Rajakaruna Mawatha Colombo 10.

පටුන

1. පිළිගැන්වීමේ ලිපිය.
2. වාර්ෂික වාර්තාව.
3. වාර්ෂික ගිණුම්.
4. විගණකාධිපතිගේ වාර්තාව.
5. විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳව සභාපතිතුමාගේ නිරීක්ෂණ.

<u>පිළිගැන්වීමේ ලිපිය.</u>

පාර්ලිමේන්තු මන්ත්‍රී සහ පුනරුත්ථාපන හා
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා ,
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නො. 35 ඒ,
ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මාවත,
කොළඹ 08.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනත 1987 අංක 29 දරණ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරි පනතේ විධිවිධාන ප්‍රකාර තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබතුමා වෙත සතුටින් පිළිගන්වමි.

මෙයට- විශ්වාසී,

ඊ.ඒ.සමරසිංහ,
සභාපති,
පුනරුත්ථාපන අධිකාරිය.

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය,
අංක. 95,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

වාර්ෂික වාර්තාව - 2011

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

(පුනරුත්ථාපන අධිකාරිය)

වර්ෂ 1987 අංක 29 දරණ පනත මගින් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (පුනරුත්ථාපන අධිකාරිය) පිහිටුවන ලදි.

2011 වර්ෂයේ දී පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය.

1. **ඒ.ඒ. සමරසිංහ මහතා - සභාපති**
2. **ඩී.කේ. ජිනදාස මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
3. **ටී. ශ්‍රීධරන් මහතා - අධ්‍යක්ෂ**
4. **ඒ. සමූන් කලීල් මහතා - අධ්‍යක්ෂ**
5. **ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා - අධ්‍යක්ෂ**

ත්‍රස්තවාදී ක්‍රියා, මහජන කැලඹීම්, දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා වලින් විපතට පත් පුද්ගලයින්ට, දේපළ සහ කර්මාන්තවලට සහන සැලසීම හා පුනරුත්ථාපනය කිරීම පුනරුත්ථාපන අධිකාරියට අයත් කාර්ය භාරය වන අතර, එම කාර්යයන් පහත දැක්වේ.

(අ) <u>ව්‍යවස්ථාපිත කාර්යයන්</u>

(අ) ත්‍රස්තවාදී ක්‍රියා නිසා විපතට පත්වූවනට සහන සැලසීම.

(ආ) විනාශ වූ / අලාභ හානි වූ නිවාස සහ දේපළ සඳහා අයිතිකරුවන් හට ආධාර සැපයීම.

(ඇ) විනාශ වූ / අලාභ හානි වූ නිවාස සහ දේපළවල පදිංචිව සිටි කුලී නිවැසියන්ට සහන සැලසීම.

(ඈ) විනාශයට පත් ගොඩනැගිලි ආදිය කඩාදැමීමට හා සුන්බුන් ඉවත් කිරීමට නියෝග කිරීම.

(ඉ) අලාභහානි වූ කර්මාන්ත හෝ වාණිජමය දේපළ වෙනුවෙන් ආධාර සැපයීම.

(ඊ) විනාශ වූ / අලාභ හානි වූ දේපළ රජයට පවරා ගැනීම.

(උ) රජයට පවරාගෙන ඇති දේපළ නියමිත හිමිකරුවන්ට ආපසු පවරාදීම.

(ඌ) රජයට පවරාගෙන ඇති දේපළවලට සම්බන්ධ අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පැන නගින ආරවුල් නිරවුල් කිරීම.

(ආ) වෙනත් කාර්යයන්

(අ) ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ගෙවන ලද, නැවත පදිංචි කිරීමේ දීමනා සම්බන්ධීකරණය සහ පසු විපරම් කිරීම.

(ආ) දේපළ විනාශවීම හෝ ඒවාට අලාභහානි සිදුවීම වෙනුවෙන් අංක. **49/89** හා **21/88** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ අංක. එම්ආර්ආර්/යූඑස්/එම්ඊපී/**01** සහ එම්ආර්ආර්/ සාමාන්‍ය/ මහජන දරණ අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුකූලව, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පහත සඳහන් අවස්ථාවල දී රජයේ/ සංස්ථා සේවකයින්ට, විශේෂ පුද්ගලයින්ට සහ සාමාන්‍ය මහජනතාවට වන්දි ගෙවීම.

1. මරණයට පත්වීම
2. තුවාල සිදුවීම
3. දේපළ හානි

(ඇ) විනාශ වූ/ අලාභහානි වූ පූජනීය ස්ථාන පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර සැපයීම.

(ඈ) විවාහ සමෘද්ධි දීමනා යෝජනා ක්‍රමය යටතේ ආධාර ගෙවීම.

(ඉ) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විපතට පත් පුද්ගලයින්ට වන්දි ගෙවීම.

(ඊ) නිවාස, ව්‍යාපාර හා කර්මාන්ත පුනරුත්ථාපනය සඳහා ණය පහසුකම් සැපයීම.

(උ) අවතැන් වූ පුද්ගලයින්/ වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(ඌ) යුද්ධයේ බලපෑමෙන් අසරණභාවයට පත්වූ පාසල් යන වයසේ දරුවන් ට ආධාර ලබාදීම.

(එ) ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය.

(ඒ) නිවාස ණය යෝජනා ක්‍රමය.

(ඔ) හොඳියුණු ගම්මානවල පීඩාවට පත් පවුල්වලට පහසුකම් සැලසීම.

(ඇ) ක්‍රියාකාරකම් විස්තර කිරීම.

1. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය.

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය සහ එහි වර්තමාන අමාත්‍යාංශය වන පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් අවතැන් වූ තැනැත්තන් නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සඳහා ආධාර ප්‍රදානය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන හඳුන්වන්නේ **"ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය"** යනුවෙනි. මෙම යෝජනා ක්‍රමය හදිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ

සටහන යටතේ **1983** වර්ෂයේ දී සකස් කරන ලද අතර, සපයන ආධාර වැඩි කිරීම සඳහා **1994** සහ **2002** වර්ෂවලදී දෙවරක්ම අදාල වෙනස්කම් සිදුකරන ලදි.

2002.02.22 දින අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පෙර නැවත පදිංචි කළ / නැවත පදිංචි කිරීමට නියමිත එක් පවුල් ඒකකයක් වෙනුවෙන් ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නැවත පදිංචි කිරීමේ දීමනාව වශයෙන් රු. **2000.00** ද නිෂ්පාදන ව්‍යාපාර ආධාර ලෙස රු. **5000.00** ද තාවකාලික නිවාස ආධාර වශයෙන් රු. **7000.00** ද, ස්ථිර නිවාසාධාර රු. **50,000.00** ක් සහ ආම්පන්න ආධාර වශයෙන් රු. **1000.00** ද වශයෙන් රු. **65,000.00** ක් වන මුළු මුදලක් ගෙවන ලදි.

<u>ස්ථිර නිවාසාධාර රු. 100,000.00</u>

අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ඒකාබද්ධ සහනාධාරය රු. **100,000.00** ක් දක්වා වැඩිකර, එය ස්ථිර නිවාසාධාර වශයෙන් රු. **75,000.00** ක මුදලක් ද, ජීවනාධාර දීමනාව වශයෙන් රු. **25,000.00** ක මුදලක් වශයෙන් වාරික **04** ක් මඟින් ගෙවන ලදි. නමුත් පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ අනුමැතිය මත මෙම යෝජනා ක්‍රමය නවීකරණය කරන ලදි.

පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් **2010** වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව, ඉහත ආධාර මුදල රු. **50,000.00** බැගින් වාරික දෙකකින් අවතැන්වූවන්ගේ විනාශවූ නිවාස නැවත ඉදිකර ගැනීම සඳහා ලබාදෙන ලදි.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පවුල් **1000** ක් වෙනුවෙන් රු. **50,000,000.00** ක මුදලක් ගෙවන ලදි. මෙම සියළු පවුල් ප්‍රධාන වශයෙන් තෝරා ගැනෙනුයේ උතුරු නැගෙනහිර පළාත් වලිනි.

2. වන්දි/ මූල්‍යමය ආධාර

2.1 <u>මරණ හා තුවාල වෙනුවෙන් වන්දි ගෙවීම.</u>

(අ). <u>රජයේ සේවක වන්දි.</u>

(i) මරණ වන්දි.

ත්‍රස්තවාදී/ ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුකොට ගෙන රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයෙකුගේ මරණයක දී ඔහුගේ යැපෙන්නන් හට රු. **200,000.00** ක උපරිමයකට යටත්ව වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

(ii) තුවාල සඳහා වන්දි.

ත්‍රස්තවාදී/ ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුකොට ගෙන රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයෙකුට තුවාල සිදුවුවහොත්, එමඟින් ඔහුට අහිමි වූ ඉපයීම් හැකියාව පිළිබඳව රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත රු.**100,000.00** ක උපරිමයකට යටත්ව, වන්දි මුදලක් ලැබීමට හිමිකම තිබේ.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත **(i)** සහ **(ii)** යෝජනා ක්‍රම යටතේ මියගිය සහ තුවාල ලැබුවන් **51** දෙනෙකු වෙනුවෙන් රු. **6,295,000.00** ක මුදලක් ගෙවන ලදි.

(ආ). <u>විශේෂ ශ්‍රේණියේ පුද්ගල වන්දි.</u>

(i) මරණ වන්දි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතු කොටගෙන ඇමතිවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පවත්වන ලද මැතිවරණයක දී තේරීපත් නොවූ අපේක්ෂකයන්ගේ මරණයකදී ඔවුන්ගේ ආසන්නතම ඥාතීන්ට උපරිමය රු. **500,000.00** ක යටත්ව උපරිම වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

(ii) තුවාල වන්දි.

ඉහත සඳහන් විශේෂ ශ්‍රේණියේ පුද්ගලයින්ට තුවාල සිදුවූ අවස්ථාවක දී රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වාර්තාවට අනුව උපරිමය රු.**500,000.00** ක වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

(ඇ). සාමාන්‍ය පුද්ගල මරණ/ තුවාල වන්දි.

ත්‍රස්තවාදී ක්‍රියා, ජනවාර්ගික ගැටුම්, මහජන කැලඹීම් සහ ඒවා මැඩපැවැත්වීම් වස් ආරක්ෂක මෙහෙයුම් හේතුකොට මියගිය තැනැත්තන්ගේ යැපෙන්නන් හට හෝ ඒ හේතුවෙන් තුවාල ලැබුවන්ට මෙම වන්දි ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වන්දි ලැබීමට හිමිකම් තිබේ.

- මරණයකදී උපරිම මුදල රු. **100,000.00**
- තුවාල සිදුවීමකදී උපරිම මුදල රු. **50,000.00**

(මෙම මුදල් වෛද්‍ය සහතිකයේ සඳහන් දුබලතාවයේ ප්‍රතිශතය මත තීරණය වේ.)

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් **227** ක් වෙනුවෙන් රු. **19,667,500.00** ක මුදලක් ගෙවන ලදි.

2.2 <u>හානි වූ / විනාශ වූ පෞද්ගලික දේපල වෙනුවෙන් වන්දි ගෙවීම.</u>

(අ) රජයේ / රාජ්‍ය සංස්ථා සේවකයින්ට වන්දි ගෙවීම.

1987 ජූලි / අගෝස්තු මාස වලදී සහ ඉන්පසුව ඇති වූ ත්‍රස්තවාදී විපත් වලින් හානි වූ දේපල වෙනුවෙන් රු.**150,000.00** ක උපරිමය දක්වා වන්දි මුදලක් ලැබීමට රජයේ සේවකයන්ට / සංස්ථා සේවකයන්ට හිමිකම් තිබේ.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් **148** වෙනුවෙන් රු. **17,473,674.00** ක මුදලක් ගෙවන ලදි.

(ආ) විශේෂ පුද්ගලයන්ට වන්දි ගෙවීම.

ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා ඇමතිවරුන්ට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පාලාත් පාලන මැතිවරණ වලදී තේරීපත් නොවූ අපේක්ෂකයන්ට අයත් අලාභ හානි වූ / විනාශයට පත්වූ දේපළ වෙනුවෙන් පිළිවෙලින් රු.**500,000.00** සහ **150,000.00** ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට මෙමගින් ප්‍රතිපාදන සලසා ඇත.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් කර නොමැත.

(ඇ) සාමාන්‍ය මහජන වන්දි ගෙවීම

ඉහත සඳහන් යෝජනා ක්‍රම දෙක යටතේ ආධාර ලැබීමට හිමිකම් නොමැති විපතට පත් පුද්ගලයින්ට හා ඔවුන්ගේ හානි වූ / විනාශ වූ වාහන ද ඇතුළුව, දේපළ වෙනුවෙන් උපරිමය රු. **100,000.00** ක් හෝ සිදු වූ අලාභයෙන් **20%** ක් හෝ යන මේ දෙකින් අඩු මුදල වන්දි වශයෙන් ලැබීමට හිමිකම් තිබේ.

මෙම වන්දි යෝජනා ක්‍රමය **1983** ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි **1996.02.16** වන දින හඳුන්වා දෙන ලදී.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් **224** දෙනෙකුට වන්දි වශයෙන් රු. **15,402,345.00** ක මුදලක් ගෙවන ලදි.

2.3 <u>හානියට පත් පූජනීය ස්ථාන වෙනුවෙන් වන්දි ගෙවීම.</u>

ත්‍රස්තවාදී ක්‍රියා නිසා අලාභහානි වූ / විනාශයට පත් වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර දෙනු ලැබේ. මුළුමනින්ම විනාශ වූ පූජනීය ස්ථාන

ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.**1,000,000.00** ක් ද, කොටසක් විනාශ වූ ස්ථාන සඳහා රු.**500,000.00** ක් ද ගෙවීම් කරනු ලැබේ.

- ♦ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පූජනීය ස්ථාන **01** සඳහා වන්දි වශයෙන් රු. **1,000,000.00** ක මුදලක් ගෙවන ලදී.

3. විවාහ සමෘද්ධි දීමනා.

රජයේ සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන අතරතුර දී විවාහපත් වන පුද්ගලයෙකුට රු.**12,500.00** ක ආධාර මුදලක් ලැබීමට හිමිකම් තිබේ. සුළු පරිමාණයේ ආදායම් උපදන ආර්ථික කටයුතු ඇරඹීමට යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ආධාර සපයනු ලැබේ. විවාහපත් වන යුවල රජය විසින් පවත්වනු කරනු ලබන සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන තැනැත්තන් වේ නම් එම ආධාර මුදල දෙගුණ වී ඔවුන්ට රු. **25,000.00** ක මුදලක් ගෙවනු ඇත.

මෙම යෝජනා ක්‍රමය **1995** වර්ෂයේ ජූලි මාසයේ දී හඳුන්වා දෙන ලදී.

- ♦ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් කර නොමැත.

4. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විපතට පත්වූවන්ට වන්දි ගෙවීම.

1997 දෙසැම්බර් **31** දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වලින් විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා ඉහත වන්දි යෝජනා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිය.

<u>ඡන්ද අපේක්ෂක.</u>

- ➢ දේපළ හානි උපරිම මුදල — රු.**500,000.00**
- ➢ මරණයකදී මුදල — රු.**500,000.00**
- ➢ තුවාල සිදුවීම් උපරිම මුදල — රු.**150,000.00**

(තුවාල සඳහා වන්දි මුදල වෛද්‍ය සහතිකය අනුව තීරණය වේ.)

ඡන්ද පොළ නියෝජිත.

- ➢ දේපළ හානි උපරිම මුදල — රු. **50,000.00**
- ➢ මරණයකදී මුදල — රු.**100,000.00**
- ➢ තුවාල සිදුවීම් උපරිම මුදල — රු. **75,000.00**

(තුවාල සඳහා වන්දි මුදල වෛද්‍ය සහතිකය අනුව තීරණය වේ.)

සාමාන්‍ය ජනතාව.

- ➢ දේපළ හානි උපරිම මුදල — රු.**50,000.00**
- ➢ මරණයකදී මුදල — රු.**50,000.00**
- ➢ තුවාල සිදුවීම් උපරිම මුදල — රු.**50,000.00**

(තුවාල සඳහා වන්දි මුදල වෛද්‍ය සහතිකය අනුව තීරණය වේ)

මෙම යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීමට පෙර අදාල විස්තර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව වන්දි ඉල්ලුම්කරුවන් **1776** දෙනෙකු වෙනුවෙන් වන්දි ගෙවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලුම්කර ඇත.

5. <u>පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමය.</u>

(i). කර්මාන්ත ණය.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා නිසා හානියට පත් ලියාපදිංචි කර්මාන්ත නැවත ආරම්භ කිරීම සඳහා **9%** ක පොලී අනුපාතයක් සහ ආපසු අයකර ගැනීමේ කාලය අවුරුදු **10** කට යටත්ව එක් කර්මාන්තයකට රුපියල් මිලියන **05** ක ණය මුදලක් ගෙවනු ලැබේ. ණය මුදල් ගෙවීම සහ ආපසු අයකර ගැනීම ලංකා බැංකුව විසින් සිදු කරනු ලබයි.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් **02** සඳහා වන්දි වශයෙන් රු. **10,000,000.00** ක මුදලක් ගෙවන ලදී.

(ii). ස්වයං රැකියා ණය ක්‍රමය.

ත්‍රස්තවාදී ක්‍රියා/ යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් සඳහා ආධාර සැපයීම උදෙසා මෙම නව ණය යෝජනා ක්‍රමය ට **2010** වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. **4%** ක සහනදායී පොලී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර **10** ක උපරිමයක ට හා එක් වසරක ණය සහන කාලයක ට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකු ට ලබා ගත හැකි උපරිම ණය මුදල රු. **25,0000.00** කි.

දිස්ත්‍රික්කය	ගෙවූ සංඛ්‍යාව	ගෙවූ මුදල රු.
යාපනය	991	144,540,000.00
වව්නියාව	147	19,520,000.00
කිලිනොච්චිය	775	122,235,000.00
මුලතිව්	38	6,725,000.00
මන්නාරම	89	14,690,000.00
මඩකලපුව	35	6,295,000.00
ත්‍රිකුණාමලය	41	17,375,000.00
එකතුව	**2116**	**318,095,000.00**

- ♦ මේ දක්වා මෙම ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් **2116** දෙනෙකු වෙනුවෙන් රු. **318,095,000.00** ක මුදලක් නිර්දේශ කරන ලදී.

(iii). නිවාස ණය යෝජනා ක්‍රමය.

ත්‍රස්තවාදී ක්‍රියා/ යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ නිවාස වැඩිදියුණු කරගැනීමට ආධාර සැපයීම උදෙසා මෙම නව ණය යෝජනා ක්‍රමය ට **2010** වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. **4%** ක සහනදායී පොළී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර **10** ක උපරිමයක ට හා එක් වසරක ණය සහන කාලයක ට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකු ට ලබා ගත හැකි උපරිම ණය මුදල රු. **250,000.00** කි.

- ♦ සමාලෝචිත වර්ෂය තුලදී මෙම නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් **184** දෙනෙකු වෙනුවෙන් රු. **36,800,000.00** ක මුදලක් නිදහස් කරන ලදී.

(iv). විපතටපත් ශිෂ්‍යයන් සඳහා වූ ශිෂ්‍යාධාර වැඩසටහන.

යුද්ධයෙන් විපතටපත්ව තම දෙමාපියන් අහිමිවූ ශිෂ්‍යන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු නොකඩවා පවත්වාගෙන යාම සඳහා පුනරුත්ථාපන අධිකාරිය මගින් එක් ශිෂ්‍යයකුට රු. **5,000.00** ක මුදලක් ලබාදෙන ලදී.

- ♦ සමාලෝචිත වර්ෂය තුලදී මෙම වැඩසටහන යටතේ ශිෂ්‍යන් **37** දෙනෙකු වෙනුවෙන් රු. **185,000.00** ක මුදලක් ගෙවන කරන ලදී.

(v). පුනරුත්ථාපන පාරිසරික මිතුරු ගම්මානය.

ගරු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නව සංකල්පයකට අනුව අනෙකුත් අමාත්‍යාංශ හා සංවිධානවල ආධාරය හා සහභාගීත්වයෙන් හානියට පත්වූ ගම්මාන සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. පුනරුත්ථාපන අධිකාරිය මගින් නිවාස ආධාර ලබාදීම, අවතැන්වූ ජනතාවට ස්වං රැකියා ණය ලබාදීම, හානියට පත්වූ පූජනීය ස්ථාන නැවත ප්‍රතිසංස්කරණය කිරීමට ආධාර ලබාදීම ආදිය ඉහත වැඩසටහන යටතේ ක්‍රියාත්මක වේ. අනෙකුත් අමාත්‍යාංශ යටතේ පවතින විවිධ ආයතන මගින් මේ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයනු ලැබේ.

ක්‍රියාකාරකම්	වියදම රු.
පල්ලිකුඩා ටැංකිය	2,300,000.00
සේවා පියස	1,000,000.00
වීරුමර් කෝවිල - පල්ලිකුඩා	1,000,000.00
නිවාස ආධාර	5,600,000.00
ස්වයං රැකියා ණය	10,000,000.00
නිවාස ණය	7,500,000.00
ධීවර ණය	33,500,000.00

2011 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ පූනගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලිකුඩා ගම්මානය සංවර්ධනය කරන ලදී.

ඒ.ඒ. සමරසිංහ,
සභාපති,
පුනරුත්ථාපන අධිකාරිය.

පුනරුත්ථාපන අධිකාරිය.
අංක. 95, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

වතුයායන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

(වර්ෂ 1987 අංක 29 දරණ පනත යටතේ ස්ථාපිත)

2011 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

විස්තරය	සටහන්	2011 (රු.)	2010 (රු.)
වත්කම්		1,300,157,110.25	1,250,667,839.01
ජංගම නොවන වත්කම්	13	197,411,082.73	141,292,694.06
දිගු කාලීන ආයෝජන	14	882,089,770.13	888,354,327.63
අයවිය යුතු ණය	15	73,647,007.21	73,801,637.21
භාණ්ඩාගාර තැන්පතු		73,920,691.06	73,920,691.06
ජංගම වත්කම්	16	73,088,559.12	73,298,489.05
වගකීම්		1,300,157,110.25	1,250,667,839.01
සමුච්චිත අරමුදල		334,299,336.92	332,753,416.23
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාව)		4,217,334.80	2,137,984.71
වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල		338,516,671.72	334,891,400.94
ප්‍රත්‍යාගණන ලාභය		5,738,374.50	5,738,374.50
මහා භාණ්ඩාගාරයෙන් ලද වෙනස් වන ප්‍රාග්ධන ප්‍රදාන		177,296,000.00	130,496,000.00
පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම		4,832,555.00	4,327,557.50
ජංගම නොවන වගකීම්	17	765,396,770.00	765,397,567.00
ජංගම වගකීම්	18	8,376,739.03	9,816,939.07

** ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*

** වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

ටී.ජී. සමරසිංහ
(සභාපති)

ආර්.එම්.එන්.කේ.කේ.අබේරත්න
(නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල්)

ඒ. දිසානායක
ලේකම්
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

තැනැත්තන් දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යඵල ප්‍රකාශය

විස්තරය	සටහන්	2011 (රු.)	2010 (රු.)
ආදායම්		110,235,080.17	146,206,263.11
භාණ්ඩාගාර ප්‍රදාන	01	94,200,000.00	130,484,000.00
පොළී	02	13,565,806.02	14,865,735.11
වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභය		2,434,394.15	21,550.00
විවිධ ආදායම්		34,880.00	834,978.00
වියදම්		106,017,745.37	144,068,278.40
සාමාන්‍ය පරිපාලන වියදම්		45,959,226.37	41,413,100.40
පෞද්ගලික පඩිනඩි	03	23,471,067.44	24,040,510.12
ගමන් වියදම්	04	290,868.50	189,252.00
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	05	2,771,852.59	2,257,929.81
ස්ථාවර වත්කම් නඩත්තුව	06	2,808,936.79	2,746,712.66
ගිවිසුම්ගත සේවා	07	10,345,502.54	7,756,399.78
වෙනත් පුනරාවර්තන වියදම්	08	5,292,875.61	1,540,855.76
ක්ෂය වීම්	09	978,122.90	2,881,440.27
මෙහෙයුම් ක්‍රියාකාරකම්		60,058,519.00	102,655,178.00
බලවත්සේ විපතට පත්වූවන් සඳහා වන්දි	10	25,997,500.00	34,720,170.00
හානියට පත් දේපළ සඳහා වන්දි	11	33,876,019.00	61,947,249.00
වෙනත් සුභසාධක ක්‍රියාකාරකම්	12	185,000.00	5,987,759.00
ආදායම ඉක්ම වූ වියදම		4,217,334.80	2,137,984.71

* *ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*
* *වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් විශයෙන් සැලකේ.*

පුනරුත්ථාපන, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	සටහන්	2011 (රු.)
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය කාර්යයන්ගෙන් අතිරික්තය / (ඌනතාව)	ජී	4,217,334.80
මුදල් නො වන චලනයන්		
එකතු කලා - ක්ෂය සඳහා වෙන් කිරීම්		978,122.90
පාරිතෝෂික වෙන් කිරීම්		504,997.50
අඩු කලා - වෙනත් ගැලපීම්	ඩී	(15,665,711.79)
කාරක ප්‍රාග්ධන ගැලපුම්වලට පෙර අතිරික්තය / (ඌනතාවය)		(9,965,256.59)
ජංගම වත්කම්වල වැඩිවීම	සී	(750,290.72)
ජංගම වගකීම්වල අඩුවීම	ඩී	(1,440,200.04)
මෙහෙයුම් කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය		(12,155,747.35)
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ		(38,392,859.00)
ණය අයකර ගැනීම්	ර	(2,674,432.83)
ආයෝජන	එෆ්	6,264,557.50
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	ඊ	(57,107,507.17)
ආයෝජන ආදායම්	එච්	15,124,523.50
මූල්‍යමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය		46,800,000.00
මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල මුදල්		
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		46,800,000.00
මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		(3,748,606.35)
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	අයි	14,528,246.81
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	ජේ	10,779,640.46

* *ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*
* *වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයිතිය සහ සංචිත වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	පාරිතෝෂික වෙන් කිරීම්	ප්‍රත්‍යාගණන සංචිතය	එකතුව
2011.01.01 දිනට ශේෂය	334,891,400.94	4,327,557.50	5,738,374.50	344,957,332.94
ප්‍රත්‍යාගණන ලාභය				-
පෙර වර්ෂයන් වෙනුවෙන් වෙන්කිරීම්				-
වර්ෂයට අදාළ වෙන් කිරීම් (ශුද්ධ)		504,997.50		504,997.50
පෙර වර්ෂවල වියදම්	(1,307,813.02)			(1,307,813.02)
පෙර වර්ෂවල ආදායම්	715,749.00			715,749.00
2011 වර්ෂයේ ශුද්ධ ඉතිරිය	4,217,334.80			4,217,334.80
2011.12.31 දිනට ශේෂය	338,516,671.72	4,832,555.00	5,738,374.50	349,087,601.22

මූල්‍ය වාර්තා සඳහා සටහන්

		2011 (රු.)	2010 (රු.)
01	**භාණ්ඩාගාර ප්‍රදාන**	94,200,000.00	130,484,000.00
	භාණ්ඩාගාර අරමුදල් - පුනරාවර්තන	94,200,000.00	130,484,000.00
02	**පොලී**	13,565,806.02	14,865,735.11
	රු. 200,000/= ලංකා බැංකු ණය සඳහා පොලී	115,061.65	-
	ණය දෙන ආයතනවලින් ලද පොලී		
	ලංකා බැංකුව	3,587,602.71	5,933,623.28
	මහජන බැංකුව	3,880,500.00	4,152,760.27
	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	430,139.49	453,153.00
	හැටන් නැෂනල් බැංකුව	120,000.00	152,396.73
	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,920,000.00	1,920,000.00
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ආයෝජන	200,000.00	827,397.27
	ලංකා බැංකු නව ණය යෝජනා ක්‍රමය	2,223,876.65	186,575.33
	පාරිතෝෂික ආයෝජන සඳහා පොලී	359,848.66	587,091.87
	සේවක ණය සඳහා පොලී		
	දේපළ ණය	448,980.59	380,867.27
	ආපදා ණය	277,868.47	269,079.37
	විශේෂ අත්තිකාරම්	1,927.80	2,790.72
03	**පෞද්ගලික පඩිනඩි**	23,471,067.44	24,040,510.12
	කාරක මණ්ඩල වැටුප්	12,622,113.47	13,794,065.24
	සේ.අ.අ. දායක මුදල්	2,010,286.45	1,546,902.91
	සේ.නි.භා.අ. දායක මුදල්	502,571.36	386,725.72
	විශ්‍රාම වැටුප් දායක මුදල්	145,058.95	
	අතිකාල හා නිවාඩු දින වැටුප්	976,979.47	1,574,402.34
	ජීවන වියදම් දීමනාව	3,992,362.50	4,074,885.89
	සභාපති දීමනා	520,000.00	323,677.42
	ක්‍රියාකාරී අධ්‍යක්ෂ දීමනා	240,000.00	206,000.00
	අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	77,000.00	16,000.00
	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	48,000.00	48,000.00
	ද්විතීයක දීමනා	145,058.95	216,690.64
	විශේෂ දීමනා	620,139.49	
	වෙනත් දීමනා	754,080.50	1,161,814.35
	භාෂා දීමනා	88,431.30	104,278.11
	පාරිතෝෂික වියදම්	728,985.00	587,067.50

04 ගමන් වියදම්	290,868.50	189,252.00
ගමන් වියදම් - දේශීය	290,868.50	189,252.00
05 සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	2,771,852.59	2,257,929.81
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	818,611.88	555,967.49
ඉන්ධන හා ලිහිසි තෙල්	1,778,240.71	1,552,957.32
නිල ඇඳුම්	65,380.00	51,700.00
පුවත්පත් සහ සඟරා	109,620.00	97,305.00
06 ස්ථාවර වත්කම් නඩත්තුව	2,808,936.79	2,746,712.66
ස්ථාවර වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව	280,094.45	776,341.93
වාහන අලුත්වැඩියා හා නඩත්තුව	2,528,842.34	1,970,370.73
07 ගිවිසුම්ගත සේවා	10,345,502.54	7,756,399.78
දුරකථන ගාස්තු	551,378.51	526,799.38
තැපැල් ගාස්තු	305,754.00	207,945.00
විදුලිය බලය සහ අනෙකුත් පහසුකම්	972,014.40	1,028,731.90
කුලී	5,025,000.00	3,600,000.00
වාහන කුලී	1,167,741.00	1,077,349.07
මුද්‍රණ ගාස්තු	1,106,155.63	606,928.20
සංග්‍රහ වියදම්	1,047,459.00	558,646.23
විගණන ගාස්තු	150,000.00	150,000.00
පොලී මත රඳවා ගැනීම් බදු	20,000.00	
08 වෙනත් පුනරාවර්තන වියදම්	5,292,875.61	1,540,855.76
සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම්	150,000.00	24,050.00
සේවකයින් සඳහා වෛද්‍ය රක්ෂණය	409,230.32	134,643.64
විවිධ වියදම්	4,306,538.79	838,089.02
ප්‍රසාධක වියදම්	117,977.00	24,847.00
ජංගම සේවා		96,268.00
නීති ගාස්තු	114,500.00	69,500.00
ජාතික සංවර්ධන බැංකු පොලී	194,629.50	353,458.10
09 ක්ෂයවීම්	978,122.90	2,881,440.27
ක්ෂය - මෝටර් වාහන	32,047.43	1,677,142.50
ක්ෂය - ලීබඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම්	317,468.14	343,261.13
ක්ෂය - කාමර වෙන් කිරීම්	152,266.00	152,266.00
ක්ෂය - දුරකථන	42,670.40	68,182.82
ක්ෂය - යන්ත්‍ර	175,262.43	100,355.05
ක්ෂය - පරිගණක	258,408.50	268,758.70
ක්ෂය - වායු සමීකරණ		271,474.07

10 බලවත්සේ විපතට පත්වූවන් සඳහා වන්දි	25,997,500.00	34,720,170.00
රජයේ සේවක	6,195,000.00	2,345,000.00
සාමාන්‍ය මහජන	19,802,500.00	32,375,170.00
11 හානියට පත් දේපළ සඳහා වන්දි	33,876,019.00	61,947,249.00
රජයේ සේවක	17,473,674.00	39,145,571.00
සාමාන්‍ය මහජන	15,402,345.00	21,338,438.00
පූජනීය ස්ථාන	1,000,000.00	665,740.00
මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් විපතට පත්වූවන්		200,000.00
විශේෂ ගණයේ පුද්ගලයන්		597,500.00
12 වෙනත් සුභසාධක ක්‍රියාකාරකම්	185,000.00	5,987,759.00
විවාහ සමෘද්ධි දීමනා	-	5,987,759.00
විපතට පත් ශිෂ්‍යයින් වෙනුවෙන් ශිෂ්‍යාධාර වැඩසටහන	185,000.00	
13 ජංගම නොවන වත්කම්	197,411,082.73	141,292,694.06
පිරිවැය		
වර්ෂයේ ආරම්භක අගය	20,390,439.18	19,837,346.18
වර්ෂය තුළ එකතු කිරීම්	7,107,507.17	846,093.00
වර්ෂය තුළ ඉවත් කිරීම් (ප්‍රත්‍යාගණන වත්කමේ ගත් මිල)	2,308,393.50	293,000.00
වත්කම් ප්‍රත්‍යාගණන වට්නාකම		
වර්ෂ අවසාන අගය	25,189,552.85	20,390,439.18
ක්ෂය		
වර්ෂයේ ආරම්භක අගය	16,650,830.12	14,072,389.85
එකතු කලා :- වර්ෂය සඳහා ක්ෂය	978,122.90	2,881,440.27
අඩු කලා :- වර්ෂය තුළ මාරු කිරීම්	2,287,397.90	293,000.00
වර්ෂ අවසාන අගය	15,341,555.12	16,660,830.12
ශුද්ධ පොත් අගය		
වර්ෂ අවසාන අගය	9,847,997.73	3,729,609.06
විස්තර සඳහා සටහන් නො. 12-1 බලන්න		
නිවාස ආධාර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	187,563,085.00	137,563,085.00
14 දිගු කාලීන ආයෝජන	882,089,770.13	888,354,327.63
ඒ.ස.බු යටතේ ණය දෙන ආයතනවලට ලබා දුන් අරමුදල්	877,762,212.63	884,410,212.63
(විස්තර සඳහා සටහන් නො. 13-1 බලන්න)		
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නව ආයෝජන		
පාරිතෝෂික ආයෝජන	4,327,557.50	3,944,115.00

15 ණය අයකිරීම්	73,647,007.21	73,801,637.21
රු. 200,000/= ලංකා බැංකු ව්‍යාපාරික ණය	4,681,213.68	4,835,843.68
රු. 25,000/= ලංකා බැංකු දේපළ යථාවත් කිරීමේ ණය	67,341,609.58	67,341,609.58
අඩමාන ණය සඳහා වෙන්කිරීම්	(6,736,352.14)	(6,736,352.14)
රු.10,000/= ලංකා බැංකු ස්වයං රැකියා ණය	9,289,484.54	9,289,484.54
අඩමාන ණය සඳහා වෙන්කිරීම්	(928,948.45)	(928,948.45)
16 ජංගම වත්කම්	73,088,559.12	73,298,489.05
දේපළ ණය	10,708,028.00	7,707,461.82
සේවක ණය (ආපදා)	6,162,549.39	6,632,208.74
ගංවතුර අත්තිකාරම්	286,864.82	
උත්සව අත්තිකාරම්	93,300.00	93,300.00
ණය දෙන ආයතනවලින් ලැබිය යුතු පොළී	43,062,118.85	42,393,509.14
පාරිතෝෂික ආයෝජනවලින් ලැබිය යුතු පොළී	515,652.51	493,549.60
ලැබිය යුතු ලැබීම්	182,330.03	101,253.43
පෙර - ගෙවුම්	91,748.82	207,107.55
තොග (ලිපි ද්‍රව්‍ය)	296,326.24	231,851.96
ණය ගැතියෝ	910,000.00	910,000.00
බැංකු ශේෂ	10,779,640.46	14,528,246.81
17 ජංගම නොවන වගකීම්	765,396,770.00	765,397,567.00
ඒ.ස.බු. යටතේ ණය දීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ - අරමුදල්	764,544,380.00	764,544,380.00
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	852,390.00	853,187.00
18 ජංගම වගකීම්	8,376,739.03	9,816,939.07
උපචිත වියදම්	300,409.33	747,939.07
තැන්පත් ගිණුම	8,076,329.70	9,069,000.00

සටහන් නො. 12-1

ජංගම නොවන වත්කම්

2011

	මෝටර් වාහන	ලීබඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම්	යන්ත්‍ර	දුරකථන	කාමර වෙන් කිරීම්	පරිගණක	වායු සමීකරණ	එකතුව
පිරිවැය								
2011.01.01 දිනට ශේෂය	6,668,570.00	5,984,199.41	1,475,328.50	813,564.84	1,522,660.00	1,550,322.60	2,375,793.83	20,390,439.18
වර්ෂය තුළ එකතු කිරීම්	6,183,000.00	146,074.50	84,896.00	29,916.67		663,620.00		7,107,507.17
වර්ෂය තුළ අපහරණය කිරීම්	2,100,000.00	34,693.50				173,700.00		2,308,393.50
2011.12.31 දිනට ශේෂය	10,751,570.00	6,095,580.41	1,560,224.50	843,481.51	1,522,660.00	2,040,242.60	2,375,793.83	**25,189,552.85**
ක්ෂය කිරීම්								
2011.01.01 දිනට ශේෂය	6,627,268.66	4,207,612.60	886,038.65	666,687.32	792,306.62	1,095,122.44	2,375,793.83	16,650,830.12
ඉවත්කළ වත්කම් ක්ෂය	2,100,000.00	15,785.40				171,612.50		2,287,397.90
වර්ෂය සඳහා වෙන් කිරීම්	32,047.43	317,468.14	175,262.43	42,670.40	152,266.00	258,408.50		978,122.90
වර්ෂය තුළ මාරු කිරීම්								
2011.12.31 දිනට ශේෂය	4,559,316.09	4,509,295.34	1,061,301.08	709,357.72	944,572.62	1,181,918.44	2,375,793.83	**15,341,555.12**
2011.12.31 දිනට ශුද්ධ පොත් අගය	6,192,253.91	1,586,285.07	498,923.42	134,123.79	578,087.38	858,324.16	0.00	**9,847,997.73**

සටහන් අංක. 13-1

2011.12.31 දිනට ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණය දෙන ආයතනවලට ලබාදුන් අරමුදල්

ආයතනය	නිවාස ණය	ව්‍යාපාරික ණය	කර්මාන්ත ණය	ස්වයං රැකියා ණය	නව නිවාස ණය	එකතුව
ලංකා බැංකුව	44,500,000.00	2,500,000.00	21,000,000.00	324,500,000.00	57,000,000.00	449,500,000.00
මහජන බැංකුව	258,700,000.00					258,700,000.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	126,352,000.00					126,352,000.00
හැටන් නැෂනල් බැංකුව	3,751,945.57	1,248,054.43				5,000,000.00
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	28,210,212.63					28,210,212.63
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	10,000,000.00					10,000,000.00
එකතුව	471,514,158.20	3,748,054.43	21,000,000.00	324,500,000.00	57,000,000.00	877,762,212.63

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ජේපී/ඊ/ආර්ජීපීඅයිඒ/ඒඑෆ්/2011

ඔබේ අංකය / உமது இல / No. }

දිනය / திகதி / Date } 2013 අප්‍රේල් 5 දින.

සභාපති
තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (ආර්පීපීඅයිඒ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (ආර්පීපීඅයිඒ) 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනතේ 8(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 ජනවාරි 08 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.</u>

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ

1.3 <u>විගණකගේ වගකීම.</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකයේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම.</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

2.2.1 <u>ගිණුම්කරණ ප්‍රමිති.</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව නියමිත ක්ෂය අනුපාතයන් මත නිසි පරිදි ක්ෂය ගණනය කර ධාරන අගය ශූන්‍ය වූ වත්කම් ආයතනයේ භාවිතයට යොදාගනිමින් පවතී නම්, එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නැවත ධාරණ අගයට එකතු කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව ධාරණ අගය ශූන්‍ය වූ රු.4,406,987 ක වත්කම් නිරීක්ෂණය වූ අතර ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතුකර නොතිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු .</u>

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). 1983 ජුලි කලබල හේතුවෙන් අවතැන් වූ ජනතාවට ප්‍රදානය කරන ලද රු.10,000 ක් බැගින් වූ ස්වයං රැකියා ණය ශේෂ සහ රු.25,000 ක් බැගින් වූ දේපල යථාවත් කිරීමේ ණය මුදල් වල ශේෂයන්හි සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව පිළිවෙලින් රු.9,289,485 ක් හා රු.67,341,610 ක් 2013 පෙබරවාරි 07 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ණය කපා හැරීම සඳහා අදාල අයදුම්පත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත්, ණය කපාහැරීමට අදාල කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති බවත්, 2013 පෙබරවාරි මාසයේදී අධිකාරියේ සභාපතිවරයා විසින් දන්වා එවා තිබුණි.

(ආ).පුනරුත්ථාපන අධිකාරිය විසින් නිවාස, ව්‍යාපාරික, කර්මාන්ත වශයෙන් ණය ලබාදීම සඳහා පොලී අනුපාත කීපයක් යටතේ ලංකා බැංකුවේ ක්‍රියාත්මක කර තිබූ ආයෝජන සඳහා වෙන වෙනම ගිණුම් පවත්වාගෙන යා යුතු වුවත්, පොලී අනුපාත සියයට 1.5 හා සියයට 2.5 වෙනුවෙන් ලෙජරයේ එක් ගිණුමක් පමණක් පවත්වාගෙන තිබුණි. මේ හේතුවෙන් එක් එක් ආයෝජනයට අදාල නියමිත පොලී අනුපාතය යටතේ පොලී ආදායම් නිවැරදි ලෙස ලැබී තිබේදැයි පරීක්ෂා කිරීමට නොහැකි විය.

2.2.3 <u>ලැබිය යුතු ගිණුම්.</u>

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ).පෞද්ගලික ආයතනයකින් කුලී පදනම මත වාහනයක් ලබාගෙන ඒ සඳහා රු.10,000 ක තැන්පතුවක් 2006 වර්ෂයේ එම ආයතනයට ලබා දී තිබූ නමුත් එය මේ වන විටත් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ).2009 වර්ෂයේ අනතුරට පත්වූ වාහනයකට ලැබිය යුතු රක්ෂණ වන්දි රු.44,300 ක් අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ).1990 වර්ෂයේ සිට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආයෝජන වලින් ලැබිය යුතු පොලී රු.32,640,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

2003 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණු රු.73,920,691 ක් වූ භාණ්ඩාගාර තැන්පතු සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

2.2.5 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවල හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව.	අනුකූල නොවීම.
(අ). ආයතන සංග්‍රහය.	
vii වන පරිච්ඡේදය 12.2.3 වගන්තිය හා ii වන පරිච්ඡේදය 13.3 වගන්තිය	වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම වැඩ බැලීමේ පදනම මත තනතුරු ලබාදී තිබූ අතර ඒ සඳහා ඉකුත් වර්ෂවලදී රු.538,410 ක් ද සමාලෝචිත වර්ෂයේදී රු.127,575 ක් වැඩ බැලීමේ වැටුප් වශයෙන් ගෙවා තිබුණි.
(ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>	
(i) මු.රෙ.371(2)	ලබාගත් අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්ය නිම කල වහාම පියවිය යුතු වුවත්, අවස්ථා 10 කදී මුළු එකතුව රු.287,400 ක් වූ අත්තිකාරම් දින 20 ත් දින 30 ත් අතර කාල පමාවකින් පසුව පියවා තිබුණි.
(ii) මු.රෙ.502(2)	මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.23,149,309 ක් වූ වත්කම්, ස්ථාවර වත්කම් ලේඛණ වල ඇතුලත් කර නොතිබුණි.
(ඇ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>	
2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය	මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු එකතුව රු.2,040,243 ක් වූ පරිගණක උපාංග හා මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

3.1. <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් රු.4,217,335 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,137,985 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලවල රු.2,079,350 ක් වූ වැඩිවීම සඳහා විපතට පත්වූවන් සඳහා වන්දි, හානියට පත් දේපල සඳහා වන්දි හා වෙනත් සුභසාධන ක්‍රියා කාරකම් සඳහා වූ වියදම් අඩුවීම සහ වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභ යන කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

3.2 <u>මෙහෙයුම් සමාලෝචනය.</u>

3.2.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා.</u>

1989 වසරේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුර පුරප්පාඩු වී පැවතුනත්, ඒ සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවිය හා යහ පාලනය.</u>

4.1 <u>අයවැය පාලනය.</u>

අයවැය ගත හා සත්‍ය වියදම් අතර සියයට 19.4 සිට සියයට 85.8 දක්වා අතර පරාසයක විචලනයක් පැවතීම නිසා ඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස අයවැය පාලනය උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලන.</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්.
(ආ) වන්දි ගෙවීම
(ඇ) නිවාස අධාර ව්‍යාපාති

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

REP/F/1/21

2013.02.07

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (ආර්පීපීඅයිඒ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක රෙපී/ඒ/ආර්පීපීඅයිඒ/එෆ්ඒ/2011 හා 2012.01.31 දිනැති කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් මාගේ නිරීක්ෂණයන් පහතින් දක්වා ඇත.

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

(අ, ආ).මෙම මුදල් අය කර ගැනීම සඳහා තව දුරටත් උත්සාහ කරමින් පවතින අතර, උත්සාහය අසාර්ථක වුවහොත් ඉදිරියේදී අඩමාන ණය වෙන්කිරීමට කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.

(ඇ). 1983 ජුලි කලබල හේතුවෙන් අවතැන් වූ ජනතාවට ලබාදුන් ස්වයං රැකියා ණය ආපසු අයකර ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී උත්සාහ දරා ඇතත් විවිධ කරුණු හේතුවෙන් අසාර්ථක වී ඇත. එබැවින් අදාළ ණය මුදල් කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර ඒ අනුව මුදල් රෙගුලාසිවලට අනුකූලව අදාළ ණය කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ණය කපා හැරීමට අදාළ අයදුම්පත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙම ණය කපා හැරීමට අදාළ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

(ඉ). 1983 ජුලි කලබල වලින් විනාශ වූ ව්‍යවසායන් යථාතත්වයට පත් කර ගැනීම සඳහා රු. 200,000/= බැගින් වූ ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව මගින් ක්‍රියාත්මක කර ඇති අතර ඊට අදාළ පොළී සහ වාරික මුදල් මෙතෙක් ලංකා බැංකුව මගින් අදාළ පුද්ගලයින්ගෙන් අයකර අප වෙත එවා ඇත. ඒ අනුව මුදල් අයකර ගැනීමේ වගකීම ලංකා බැංකුව සතු වන අතර මෙම ණය ලබා දුන් දින සිට මේ දක්වාම පොළී ගණනය කිරීමක් අධිකාරිය විසින් සිදුකර නොමැති බැවින් මෙසේ කටයුතු කර ඇත.

(ඊ). ණය යෝජනා ක්‍රමයන්හි 2.5% සහ 1.5% ක් ලෙස පොලී අනුපාත ඇති ආයෝජන සඳහා 2013 වසරේ සිට වෙන වෙනම ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.

(උ). එක් එක් මූල්‍ය ආයතනවල ආයෝජනයන් වෙනුවෙන් අදාළ ආයෝජනයන් කර ඇති දින ගණන් පදනම් කරගෙන නිවැරදිව පොලී ගණනය කර ඇති අතර එවා උපලේඛණ මගින් මූල්‍ය ප්‍රකාශන වලදී ඉදිරිපත් කර ඇත. මෙම උප ලේඛණ සම්බන්ධයෙන් කිසියම් සංශෝධනයක් කලයුතු නම් ඒ පිළිබඳව ඔබගේ කාරුණික උපදෙස් බලාපොරොත්තු වෙමි.

(ඌ). 2012 අවසාන ගිණුම් සඳහා වූ ජ'නල් සටහන් අංක 02 මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පුනරුත්ථාපන අධිකාරිය විසින් ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කිරීමක් සිදුකර නොතිබූ බැවින් මේ වන විට අදාළ ස්ථාවර වත්කම් ලේඛණ මුල සිට සකස් කිරීම සඳහා නිලධාරීන් යොමු කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18.

2013 වර්ෂයේදී අධිකාරිය සතු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු සිදුකිරීමට නියමිත අතර ඒ අනුව වත්කම්වල ධාරණ අගය ඉදිරියේදී නිවැරදි කිරීමට හැකිවන බව කාරුණිකව දන්වමි.

(ආ). ආයතන සංග්‍රහය.

(i). vii වන පරිච්ඡේදය

12. 2. 3 වගන්තිය

ii වන පරිච්ඡේදය 13. 3

අධිකාරිය සඳහා අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග ඇතැම් තනතුරුවල වෙනස්වීම් සිදු විය. ඒ අනුව නව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට සිදු විය. මෙම කාලසීමාව අතරතුර අධිකාරියේ සේවා අවශ්‍යතාවය මත තනතුරු කිපයක් සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් බඳවා ගැනීමට සිදු වූ අතර මේ වන විට මෙම තත්ත්වය නිසි ක්‍රමවේදයන්ට අනුව නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.

(ඈ) ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි

අංක 371 (2)

විගණනයෙන් පෙන්වාදුන් පරිදි අත්‍යා. අග්‍රිමයන් පියවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් අතර මේ වන විට ඒ අනුව කටයුතු ඉටු කරන බව කාරුණිකව දන්වමි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3. 1. 2 අයවැය හා විචලනයන්.

අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලකයක් ලෙස යොදා ගැනීමට උපරිමයෙන් කටයුතු කරනු ලබන අතර විශේෂිත අවස්ථාවන් හා කාරණයන් හේතු කොට බැහැරවීම් සිදු වී ඇත. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි

3. 2 මෙහෙයුම් සමාලෝචනය.

3. 2. 1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(i). නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා නිත්‍ය නිලධාරියකු බඳවා ගැනීමට මේ වන විටත් පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කර ඇත. ඒ අනුව නුදුරේදීම මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ii). මේ වන විටත් ස්ථාවර වත්කම් ලේඛණ පිළියෙල කිරීමට නිලධාරීන් යොමු කර ඇති අතර ඉතා ඉක්මනින් මෙම **කටයුතු** අවසන් කළහැකි වන බව දන්වමි.

(iii). ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයවියයුතු ආයෝජන පොළී මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් එම ආයතනය සමග මේවන විටත් සාකච්ඡාවට කීපයක්ම පවත්වා ඇත.ඒ අනුව අදාළ ආයෝජන මුදල් සුළු වශයෙන් අයවෙමින් පවතින අතර ඉතිරි ආයෝජන හා පොළී සම්බන්ධයෙන් ගතයුතු ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව ආයතන දෙකම අධ්‍යක්ෂ මණ්ඩල විසින් සලකා බලමින් පවතී. ඉදිරියේදී මෙම මුදල් වෙනත් ආයෝජන ක්‍රමයක ආයෝජනය කිරීම හෝ ආපසු අයකර ගැනීම මෙහිදී තීරණය වනු ඇත.

සභාපති

පුනරුත්ථාපන අධිකාරිය